**ඇඹිලිපිටිය නගර සභාව - 2023**

**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඇඹිලිපිටිය නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය සතු රු.15,993,900ක් වූ ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථාන භූමිය නගර සභාවේ වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | එකතුව රු.3,842,752ක් වූ ඉදිකිරීම් 03ක් හා පරිගණක උපාංග ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ඉඩමක් රු.318,700කට ප්‍රාග්ධනිත කර තිබුණි. එහෙත්, එය පවරා නොගැනීම නිසා මුදල් ආපසු ලැබී තිබුණ ද, එය ජංගම නොවන වත්කම්වලින් ඉවත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | කඩා ඉවත් කළ වාහන අංගනයේ වටිනාකම රු.410,303ක් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක තොගය රු.1,313,622ක් තොග ගිණුමට හර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | පොදු ගිණුමෙන් නාගරික සංවර්ධන අධිකාරී ගිණුමට සිදු කළ රු.4,500,000ක මුදල් මාරුකිරීම වියදමක් සහ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි දෝෂ ඇති නොවීමට කටයුතු කරමි. | -එම- |
| (උ) | වැටුප් ප්‍රතිපූරණය සඳහා 2023 වර්ෂයේ ලද රු.4,626,023ක් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

**1.7 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව, 2017 වර්ෂයේදී ලබා දී තිබුණු රු.150,000ක අත්තිකාරමක් පියවා නොතිබුණි. | මෙම අත්තිකාරම මේ දක්වා පියවා නැත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.24,752,687ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.26,452,472ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 18,516,000 | 19,498,383 | 25,412,093 | 56,414,123 | 18,303,000 | 19,456,728 | 13,686,874 | 61,541,824 |
| කුලී | 26,166,600 | 15,013,014 | 16,639,562 | 3,487,716 | 25,334,200 | 11,746,140 | 13,042,383 | 6,131,941 |
| බලපත්‍ර ගාස්තු | 3,783,500 | 4,385,339 | 4,332,839 | 211,500 | 3,156,500 | 1,891,797 | 1,766,796 | 589,000 |
| වෙනත් ආදායම් | 11,285,700 | 12,764,873 | 6,692,136 | 10,000 | 10,089,700 | 7,390,232 | 6,924,468 | - |
| | 59,751,800 | 51,661,609 | 53,076,630 | 60,123,339 | 56,883,400 | 40,484,897 | 35,420,521 | 68,262,765 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 04ත් වසර 15ත් අතර කාලයක් පැරණි හිඟහිටි කඩකාමර කුලී රු.3,033,281ක් අයකර නොතිබුණි. එමෙන්ම, බස් නැවතුම්පොළ කඩකාමර 22ක් සඳහා ගිවිසුම්ගත වී නොතිබුණි. | ලිපි මඟින් දැනුවත් කර ඇත. එහෙත් ගිවිසුම්වල පවතින අඩුපාඩු හා ගිවිසුම්ගත නොවීම ආදී කරුණු නිසා නීතිමය පියවර ගැනීමට නොහැකි වී ඇත. එම හිඟ මුදල් කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත ලිපි යොමු කර ඇත. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |
| (ආ) | 2023 වර්ෂය ද ඇතුළුව ඉකුත් වර්ෂ 05ක් වෙනුවෙන් රු.520,000ක ත්‍රීරෝද රථ ගාස්තු හිඟහිටිව පැවැතිණි. ත්‍රීරෝද රථ සංගමය හා පැවති සාකච්ඡාවලින් එකඟතාවක් නොතිබීම මෙයට හේතුව වී තිබුණි. | මේ සඳහා වෙනම අතුරු ව්‍යවස්ථාවක් නොමැත. පොදු අතුරු ව්‍යවස්ථාවක් අනුව මෙම ගාස්තු අය කරන නිසා ගාස්තු නොගෙවීමට එරෙහිව නීතිමය කටයුතු කළ නොහැකි වී ඇත. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට හා ගාස්තු අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වසර 05ට වඩා පැරණි හිඟහිටි වරිපනම් රු.43,391,747ක් මේ දක්වාම අයකර නොතිබුණි. | අවසන් නිවේදන යවා දේපළ තහනම් කිරීමේ කටයුතු සිදුකර ඇත. | නගර සභා ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනීත්‍යානුකූලව ගොඩනැගිල්ලක් කඩා ඉවත් කිරීමට එරෙහිව ලබාදුන් අධිකරණ තීන්දුවක් මත වන්දි ගෙවීමට සිදුවීමෙන් සභාවට රු.976,600ක පාඩුවක් සිදු වී තිබුණි. | අධිකරණ නියෝගය අනුව කටයුතු කිරීමට සිදු විය. | සභාවට සිදු වූ අලාභය ඊට වගකිව යුතු අයගෙන් අය කළ යුතු වේ. |

**3.2 නිෂ්ක්‍රීය වත්කම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තෙකලා විදුලිය නොමැතිවීමෙන් 2022 ජූලි මස ලද රු.950,000ක් වූ බෙලර් යන්ත්‍රය 2023 දෙසැම්බර් වන විටත් නිෂ්කාර්යයව පැවැතිණි. | විදුලි සැපයුම ලබා ගැනීමෙන් පසු කඩිනමින් මෙම යන්ත්‍රය ස්ථාපනය කිරීමට කටයුතු කෙරේ. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වේ. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභා නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේදී රු.755,770ක් වැඩිපුර ගෙවා තිබුණි. ඇස්තමේන්තු සකස් කිරීමේදී, සබරගමුව පළාත් ගොඩනැගිලි රේට වෙනුවට බස්නාහිර පළාත් ගොඩනැගිලි රේට භාවිතා කර තිබුණි. | වැඩිපුර ගෙවීම් රඳවුම් මුදලින් අඩු කරගැනීමට කටයුතු කරමි. අනෙක් ගැටළුව සම්බන්ධයෙන් උපදේශක ආයතනයෙන් ලද පිළිතුරු සමඟ ඉදිරි කටයුතු සිදුකිරීමට අපේක්ෂිතය. | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතු වේ. |